# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2110/47 - 2019 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2019.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

### කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යයන් ගරු කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාට පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ගෙන් පහත උපලේඛනයේ දක්වා ඇති නිශ්චිත කාර්යයන් ඉටු කිරීමේ වගකීම් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය වසන්ත ලක්ෂ්මිනාත් අලුවිහාරේ මැතිතුමා වෙත පවරනු ලබන බවත්, එසේම මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන සියළු කාර්යයන් සම්බන්ධයෙන් සොයා බැලීමේ, මැදිහත් වීමේ හා සම්බන්ධීකරණය කිරීමේ අවස්ථාව තව දුරටත් රාජ්‍ය අමාත්‍යවරයාට ඇති බවත් ප්‍රකාශයට පත් කරමි.

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත* |
|---|---|---|
| 1. ඵලදායී ඉඩම් කළමනාකරණය විධිමත් ජල සංරක්ෂණයක් හා උසස් මානව සම්පත් උපයෝජනයක් තුළින් පාරිසරික සම්පත් සංරක්ෂණය හා කෘෂි ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය දායකත්වය සැපයීම. | 1. හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (හදබිම) | 1. 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත |
| 2. විවිධ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන් සඳහා අධ්‍යාපන හා පර්යේෂණ අවස්ථා පුළුල් කිරීමට පියවර ගැනීම. | 2. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 2. 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂි කාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පනත |
| 3. ශ්‍රී ලංකාවේ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණය වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන පර්යේෂණ දැන හඳුනාගෙන ඒ අනුව සංවර්ධන කාර්යභාරයන් සිදු කිරීමත් නිෂ්පාදනවල හා ඒවා | 3. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 3. 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ විධිවිධාන අදාළ වන පරිදි |


1A - G 29469 — 377 (2019/02)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත* |
|---|---|---|
| අලෙවියේ ගුණාත්මක බව වර්ධනය කිරීමට ඉවහල් වන ශිල්පීය ක්‍රම ප්‍රචලිත කිරීම පශ්චාත් අස්වැන්න තාක්ෂණය පිළිබඳ පුහුණු කිරීම් සිදු කිරීම තුළින් දේශීය කෘෂි නිෂ්පාදන වල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම. | | |

පී. හැරිසන්,
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන,
වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 13 වැනි දින,
නො : 288,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය,
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

03 - 202

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.